**කඩුගන්නාව නගර සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**---------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.**

**1.2 මතය.**
**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂයේදී මිල දී ගෙන තිබූ කාර්යාල උපකරණ විෂයයන් 07 ක වටිනාකම වූ රු.114,913 ක් ගිණුම්ගත කර නොතිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.18,500 ක හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය එම ගිනුමට බැර කර හිඟ හිටි උසාවි දඩ ගිණුමට හර කිරීම හේතුවෙන් හිඟ හිටි උසාවි දඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්වා තිබූ නමුත් හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගිණුමේ හිඟයක් දක්වා නොතිබුණි.**

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**
**------------------------**

**ගිණුම් විෂයයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.761,933 ක් වූ අතර, උපලේඛන අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.721,958 ක් වුයෙන්, රු.39,975 ක නොසසැදීමක් වීය.**

**1.3.3 ලැබියයුතු ගිණුම්.**
**--------------------**

**2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ එකතු වටිනාකම රු.2,437,489 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.480,950 ක් වී තිබුණි.**

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**
**-------------------------**

**2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.17,309,065 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.17,279,545 ක් වියදම් ණයහිමියන් වූ අතර, එයින්, අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.2,298,801 ක් විය.**

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

ගිණුම් විෂයයන් 03 ක අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.335,365 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහය.<br>261.2.2 ඡේදය. | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 ක දී ලබා දී තිබූ එකතු වටිනාකම රු.49,607 ක් වූ අත්තිකාරම් 2015 ජූනි 25 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (i) | මු. රෙ. 571(2) | රු.197,641 ක් වටිනා ඉකුත් තැන්පතු අවස්ථා 59 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි විධි විධාන අනුගමනය කර නොතිබුණි. |
| (ii) | මු.රෙ.396 | ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු.106,024 ක් වටිනා චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස් 06/06/02 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය. | සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 10 දෙනෙකුගෙන් සේවක ඇප රු.42,500 ක ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,979,594 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,789,243 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,809,649 ක අඩුවීමක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය.

**2.2.1** වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.6,203,984 ක් වුවත්, විගණනයට ලබා දුන් තොරතුරුවලට අනුව, හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.6,209,715 ක් වූයෙන්, රු.5,731 ක නොසැසදීමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.5,191,876 ක වරිපනම් බදු ශේෂයක් හිඟව පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.8,193,126 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 48 ක් හා සියයට 57 ක මට්ටමක පැවතුණ බැවින්, 2014 දෙසැම්බර් 31 දිනට වූ රු.6,209,715 ක අය වියයුතු ශේෂය අය කර ගැනීමට නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2** බදු කුළී.

(අ) කඩුගන්නාව සති පොළෙන් 2008 වර්ෂයේ සිට අය වියයුතු රු.252,856 ක හිඟ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 24 ක මාස 01 සිට වසර 07 පමණ කාල පරාසයක් තුළ පවතින රු.225,952 ක කුළී හිඟව පැවතුණු අතර, හිඟ කඩ කුළී අදාළ ගිවිසුම පරිදි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.169,658 ක් හා මුද්දර ගාස්තු රු.1,253,550 ක් ලැබියයුතුව පැවතුණි.

**2.2.4** වෙනත් ආදායම්

නගර සභා (අධිකාරිය 255) ආඥා පනතේ 164(2) වගන්තියේ විධිවිධාන අනුව සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති හෝටල්/ආපන ශාලා 04 කින් සියයට 1 ක ගාස්තුව 2014 වර්ෂය සඳහා අය කර ගෙන නොතිබුණි.

**2.2.5** දැන්වීම් පුවරු ගාස්තු

(i) 2014 දෙසැම්බර් 05 දිනැති අංක 1892 ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ නියමයන් අනුව ස්ථිර දැන්වීම් පුවරුවක වර්ග අඩියක් සඳහා රු.100 ක ගාස්තුවක් අය කළයුතු වුව ද, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 56 කින් එකතුව රු.876,300 ක් වූ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ප්‍රදර්ශනය කරනු ලබන බැනර්, වර්ග අඩියක් සඳහා රු.50 ක ගාස්තුවක් අය කළයුතු වුව ද, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ බැනර් 05 කින් රු.3,500 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දැන්වීම පුවරු ආදායම සහ පුවරු සංඛ්‍යාවෙහි 2013, 2014 හා 2015 වර්ෂය සමග සැසදීමේදී 2015 වර්ෂයේ සීඝ්‍ර අඩුවීමක් නිරීක්ෂණය විය.

**2.2.6** **විනෝද බදු**

**--------------**

**සභා බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන සීතා සිනමා ශාලාවේ චිත්‍රපට දර්ශනවල දි නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර, විනෝද බදු ආඥා පනතට අනුව සභාවේ මුද්‍රාව තැබීම සදහා ඉදිරිපත් කළයුතු වුවත්, එසේ ඉදිරිපත් කිරීමකින් තොරව ප්‍රවේශ පත්‍ර නිකුත් කරන බව 2015 ජුනි 23 දින කරන ලද පරික්ෂාවේදි නිරික්ෂණය විය. ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නොතිබුණි.**

**3.** **මෙහෙයුම් සමාලෝචනය.**

**--------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**---------------------------------**

**කඩුගන්නාව නගරයේ පිහිට තිබෙන සභාවේ පාලනය යටතේ පවතින මහජන වැසිකිළිය භාවිතා කරන්නන්ගෙන් මුදල් අය කිරීම සඳහා සනීපාරක්ෂක කම්කරුවෙකු වෙත පවරා තිබුණු අතර, රු.300, රු.400, රු.500 යනාදි ප්‍රමාණයෙන් දෛනිකව මුදල් රැස් කර සභාව වෙත ගෙවීම් කර තිබුණි. එසේ වුවත් මුදල් අය කිරීමේ හා ප්‍රේෂණය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.**

**3.2** **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------**

**කඩුගන්නාව පොදු ක්‍රිඩාංගනයේ ක්‍රීඩාගාරයට පිටුපසින් රු.992,447 ක වියදමකින් අළුතින් ඉදිකර තිබු වැසිකිලි පද්ධතියේ හා නාන කාමර වල ඉදිකිරීම් 2014 වර්ෂයේදි අතරමග නවතා දමා තිබීම හේතුවෙන් එම ස්ථාන අපවිත්‍ර කර තිබුණු අතර එම ස්ථාන වල මත්පැන් හා දුම් පානයට යොදා ගැනීම හා විවිධ අපචාර සඳහා භාවිතා කර ඇති බවක් නිරික්ෂණය විය.**

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය.**

**-----------------------**

**(අ)** **පිළිමතලාව සති පොළ භූමිය සංවර්ධනය කිරීම - 2 අදියර - වැය කළ මුදල රු.592,615**

**------------------------------------------------------------------------------**

**මෙම කාර්මාන්තය සම්බන්ධයෙන් 2015 ජුනි 23 කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණ අනාවරණය විය.**

**(i)** **සති පොළ භූමිය 1:2:4 (3/4)" සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදියයුතු වුවත්, එම ප්‍රමාණයෙන් යොදා නොතිබුණු අතර, අතින් කැඩිය හැකි මට්ටමේ ඉතා දුර්වල මිශ්‍රණයක් යොදා තිබුණි.**

**(ii)** **100′ x 34′ x 4" හා 25′ x 8′ x 4" ප්‍රමාණයක කොන්ක්‍රීට් කිරීමට ඇස්තමේන්තු කර, තිබුණ නමුත්, ඉදි කරන ලද කොටසේ ස්ථාන 05 ක් කඩා පරීක්ෂා කිරීමේ දි, 2/81′ x 8′ x 4" කොටසක් හැර ඉතිරි කොටස්වල ඝනකම අගල් 1.4 හා 1.8 ක ප්‍රමාණයෙන් ඉදි කර තිබුණි. මේ අනුව, මෙසේ ඉදි කරන ලද කොටස් වල කොන්ක්‍රීට් මිශ්‍රණය ද දුර්වලව පැවතියෙන්, ප්‍රමිතියට අනුකූල නොවු කොන්ක්‍රීට් කියුබ් 7.48 ක් සඳහා රු.342,219 ක් අක්‍රමික ලෙස සහතික කර 2014 දෙසැම්බර් මාසයේදි ගෙවා තිබුණි.**

**(ආ)** **කඩුගන්නාව සති පොළ සංවර්ධනය කිරීම - වැය කළ මුදල රු.1,858,027**

**------------------------------------------------------------------------------**

**මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2015 ජුනි 23 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු අනාවරණය විය.**

(i) කර්මාන්තයේ විෂයය අංක 06 යටතේ සති පොළ භූමියේ කාණු ඉදි කිරීමේ දි කාණුවේ පතුල 1:2:4 (3/4)" සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් 4" ඝනකමින් කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණ ද ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දි, යොදා තිබුණු කොන්ක්‍රීට් අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල මිශ්‍රණයක් වූ අතර, පතුලේ සමහරක් ස්ථානයන් හී කොන්ක්‍රීට් යොදා නොතිබුණි. මෙම කටයුතු නිවැරදි ලෙස පරීක්ෂා කර, මැණුම්පත් ඉදිරිපත් නොකිරීම නිසා, (141ʹ - 8" x 1ʹ-8" x4") කියුබ් 0.77 ක් සඳහා රු.33,732 ක් නොකළ වැඩ සඳහා ගෙවා තිබුණි.

(ii) විෂයය අංක 06 යටතේ කාණු කොන්ක්‍රීට් කිරීම සඳහා 141ʹ - 8" ක දිග ප්‍රමාණයකට ඇස්තමේන්තු කර ගෙවා ඇතත්, භෞතික පරීක්ෂණයේ දි, 134ʹ ක් පමණක් ඉදි කර තිබුණි. ඒ අනුව, අඩි 7 අගල් 08 ක් වූ ඉටු නොවූ වැඩ වෙනුවෙන් රු.4,380 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(iii) අයිතම අංක 08 යටතේ 1:2 ½ :5 (1") සිමෙන්ති, වැලි හා ගල් මිශ්‍රණයෙන් අගල් 4 ක් ඝනකමින් ඉදි කළ කොන්ක්‍රීට් ඇතිරුම 2015 ජූනි 23 දින භෞතික පරීක්ෂණයේ දි, ස්ථාන 05 ක් පමණ කඩා පරීක්ෂා කිරීමේ දි යොදා තිබුණු කොන්ක්‍රීට් අතින් කැඩිය හැකි මට්ටමේ ඉතා දුර්වල මිශ්‍රණයක් යොදා ඉදි කර තිබුණු අතර, එහි ඝනකම අගල් 02 ක ප්‍රමාණයක් විය. ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුකූල නොවන ලෙස ඉදි කිරීම් කියුබ් 5.39 ක් වෙනුවෙන් රු.521,686 ක් ගෙවා තිබුණි.

(ඇ) කඩුගන්නාව පොදු ක්‍රීඩා පිටියේ වැසිකිළි පද්ධතිය ඉදි කිරීම හා සංවර්ධනය - වැය කළ මුදල රු.992,447
--------------------------------------------------------------------------------

ඉදි කර තිබුණු වැසිකිළි පද්ධතියේ දොරවල් නොයෙදීම හේතුවෙන්, වැසිකිළි පද්ධතිය දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණු අතර, බිම සඳහා අතුරා තිබුණු ගෙබිම් උළු හානී සිදු වී කැඩී බිඳී තිබුණි. එසේම, වැසිකිළි පද්ධතියේ පිටු පස බිත්තිවලින් වැසිකිළි කාමර අභ්‍යන්තරයට ජලය කාන්දු වී තිබුණි. වැසිකිළි පද්ධතිය සඳහා රු.992,447 ක් වැය කර, අතර මග නවතා ඉතිරි වැඩ සම්පූර්ණ නොකිරීම හේතුවෙන්, එය ප්‍රයෝජනයට ගැනීමට නොහැකිව විනාශ වීමට ඉඩ හැර තිබු බව 2015 ජුනි 23 කරන ලද භෞතික පරීක්ෂාවේදි අනාවරණය විය.

(ඈ) නගර සභාව විසින් කොන්ත්‍රාත් වැඩ ඉටුකරවා ගැනීමේදි විශේෂයෙන් කොන්ක්‍රීට් යෙදීම වැනි ඉදිකිරීම් කාර්යයන්හිදි තාක්ෂණික ක්‍රම භාවිතා නොකරන ලද අතර සභාව විසින් එම තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමක් හෝ ඒ සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

3.4 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

2015 මැයි 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව සමග සැසදීමේදි පුරප්පාඩු තනතුරු 10 ක් පැවතින.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**
-------------------------------------

**4.1** **සංයුක්ත සැළැස්ම**
-------------------

**සමාලෝචිත වර්ෂයේදී සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙල කර නොතිබුණි.**

**4.2** **ප්‍රසම්පාදනය.**
----------------

**සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3** **ක්‍රියාකාරී සැළැස්ම.**
---------------------

**සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.4** **අභ්‍යන්තර විගණනය.**
----------------------

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**4.5** **අයවැය පාලනය.**
------------------

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අය වැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම හා වියදම තථ්‍ය ආදායම හා වියදම් සමග සැසදීමේ දි ආදායම් විෂයයන් 02 ක සියයට 53 සිට සියයට 84 දක්වා ද, වියදම් විෂයයන් 04 ක සියයට 16 සිට සියයට 70 දක්වා ද, විචලනයන් නිරික්ෂණය වු බැවින්, අය වැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරික්ෂණය විය.**

**5.** **පද්ධති හා පාලනය.**
-------------------

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **ගිණුම්කරණය.**
**(ආ)** **අයවැය පාලනය**
**(ඇ)** **ආදායම් පරිපාලනය.**
**(ඈ)** **වත්කම් හා කළමනාකරණය**
**(ඉ)** **කොන්ත්‍රාත් පරිපාලනය.**